(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 183.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2012 මැයි මස 10 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0989/’10

1.

ගරු රවි කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විදේශයන්හිදී කටයුතු කිරීම සඳහා, විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් මහජන සම්බන්ධතා (PR) සමාගම් සමග ගිවිසුම්වලට එළඹී හෝ එබඳු සමාගම්වල සේවය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(iii) එම සමාගම් සමඟ ගිවිසුම්වලට එළඹුනු දිනයන් කවරේද;

(iv) එම සමාගම් තෝරා ගන්නා ලද්දේ ටෙන්ඩර් පටිපාටියකට අනුවද;

(v) නොඑසේ නම්, එය ටෙන්ඩර් පටිපාටියකින් තොරව සිදු කිරීමට හේතු කවරේද;

(vi) එම එක් එක් සමාගම වෙත මාසිකව ගෙවනු ලබන මුදල ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද;

(vii) ඔවුන්ගේ සේවයෙන් අත්වන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉදිරියේදී විදේශයන්හිදී කටයුතු ඉටු කිරීම සඳහා තවත් මහජන සම්බන්ධතා සමාගම්වල සේවය ලබා ගන්නේද;

(ii) ශ්‍රී ලංකාව වෙනුවෙන් සේවය සලසන ඇමෙරිකා එක්සත් ජනපදයේ කර්විස්, එක්සත් රාජධානියේ බෙල්පොටෙන්ජර් හා ඉන්දියාවේ ලෙක්සිකන් වැනි සමාගම් විසින් ඉටු කරනු ලබන කාර්යයන් පිළිබඳ විස්තර කවරේද;

(iii) මෙම සමාගම්වල හිමිකරුවන්ගේ නම් කවරේද;

(iv) එම සමාගම් විදේශ ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේ කාර්යයේ නියැළීම සඳහාත් උත්සාහ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් කරන ලද පරිද්දෙන් අමාත්‍යාංශ සේවකයින්ට අයත් කාර්යභාරයන් අතරින් එක් කාර්යයක් බාහිර ආයතනවලට පැවරීම හේතුවෙන් එම සේවකයින් මන්දෝත්සාහී බවට පත්වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1289/’11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගම්මාන දාහතකට පමණ තැපැල් පහසුකම් නොමැතිවීමෙන් එම ප්‍රදේශයේ ජනතාව මහත් පීඩාවට පත්ව සිටින බවත්;

(ii) එම ප්‍රදේශයේ දුර බැහැර ගම්මානවල තැපැල් කාර්යාල ඇතත්, ඒවායේ සේවය කරන තැපැල්කරුවන්ගේ හිඟයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම තත්ත්වය මඟ හරවා එම ප්‍රදේශයේ ජනතාවට කාර්යක්ෂම තැපැල් පහසුකම් ලබා දීමට කඩිනමින් කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා වැඩ පිළිවෙළක් සකසා තිබේද;

(iii) එම වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1731/'11

3.

ගරු අනුර දිසානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයින තුළ පිහිටුවා ඇති ශ්‍රී ලංකා ටෙලිකොම් ඇමතුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඇමතුම් මධ්‍යස්ථාන පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) ඇමතුම් මධ්‍යස්ථානවල සේවයේ යොදවා ඇති සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම සේවකයින් අතරින් අවුරුදු 55 - 60 අතර වන සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(v) එම පිරිස සේවයේ යොදවා ඇති ක්‍රමවේදය කවරේද;

(vi) ඔවුන් සේවයේ යෙදවීමේදී නම්‍යශීලී සේවා මුර ක්‍රමවේදය හඳුන්වාදී තිබේද;

(vii) එසේ නම්, එම ක්‍රමවේදයට අනුව අවුරුදු 55 – 60 වයස් කාණ්ඩයේ කාන්තාවන් සේවයේ යෙදවීම තුළින් ඔවුන්ගේ මානව අයිතීන් උල්ලංඝණය වන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1908/'11

4.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්ථිර නිෂ්පාදකවරයකුගේ තනතුරට පත්කරනු ලැබීම සඳහා පුද්ගලයකු සතුව තිබිය යුතු මූලික සුදුසුකම් කවරේද;

(ii) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ දෙමළ සේවයේ දැනට සේවය කරන ස්ථිර නිෂ්පාදකවරුන්ගේ සංඛ්‍යාව කොපමණද; සහ

(iii) ඉහත සඳහන් එක් එක් ස්ථිර නිෂ්පාදකවරයාගේ සුදුසුකම් විස්තර සහිතව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1979/’11

5\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ඇඹිලිපිටිය කඩදාසි කම්හල වෙනුවෙන් රජය සිදු කර ඇති ආයෝජන කවරේද;

(ii) මේ වනවිට එම ආයතනයේ සේවය කරන සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනය ලැබූ ලාභය හෝ අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඇඹිලිපිටිය කඩදාසි කම්හල පෞද්ගලීකරණය කිරීමට හෝ යම් පදනමක් මත පෞද්ගලික ආයතනයකට පැවරීමට හෝ කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(iii) එසේ නම්, එකී ටෙන්ඩර් පිළිබඳ විස්තර කවරේද;

(iv) එම ආයතනය පෞද්ගලික අංශයට ලබා දෙන්නේ නම්, එය ලබා දෙන මුදල හා කාලසීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2002/’11

6\.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පුත්තලම - කල්පිටිය මාර්ගයේ, 7 වැනි සහ 9 වැනි කණු අතර මහා මාර්ගය හා පුත්තලම කලපුව අතර පිහිටි බිම් තීරුවේ වූ කඩොලාන රෝපණය කිසියම් පිරිසක් විසින් විනාශ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කඩොලාන රෝපණය පිහිටි බිම් තීරුව කිසියම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරන්නේද;

(ii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අය කවුරුන්ද;

(iii) එම ව්‍යාපෘතියට අයත් බිම් තීරුවේ වර්ග ප්‍රමාණය කොපමණද;

(iv) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලබාගෙන ඇති නීතිමය ප්‍රතිපාදන කවරේද;

(v) වයඹ පළාත් පාරිසරික අණපනත්වලට අනුව එම ව්‍යාපෘතිය සඳහා පූර්ව පාරිසරික ඇගයීම් වාර්තාවක් ලබා ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2028/’11

7\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) මෙරට නොයෙකුත් ප්‍රදේශයන්හි වෙසෙන දක්ෂ නිර්මාණ ශිල්පීන්ගේ නව නිර්මාණයන්, නව සොයාගැනීම් සහ ඔවුන් විසින් නිපදවනු ලබන යන්ත්‍ර සූත්‍ර පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා ක්‍රමවේදයක් තිබේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශක්තිමත් ආර්ථික මට්ටමක් නොමැති මෙරට නව නිපැයුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකුට තම නිපැයුම් වැඩිදියුණු කර ඉදිරියට ගෙන යැමට හැකියාවක් නොමැති බවත්;

(ii) සමාජයේ ඇති හැකි අය එම පිරිසට මූල්‍යයමය උපකාර ලබා දීමට මැලිකමක් දක්වන බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ඇ) (i) නව නිපැයුම්කරුවන්ගේ නිෂ්පාදන තුළින් මෙරට ආර්ථිකයට හා ප්‍රජාවට ලැබෙන ප්‍රතිලාභ නිවැරදි ඇගයීමකට ලක්කිරීමටත්;

(ii) ඒ අනුව ඵලදායි නව නිපැයුම් කළ නිපැයුම්කරුවන්ට දිරිදීම් ලබා දී එම භාණ්ඩ නිෂ්පාදනය කර්මාන්තයක් ලෙස වැඩි දියුණු කිරීමටත්;

අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2058/'11

8.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සේවක අර්ථසාධක අරමුදලේ කළමනාකරණ කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කෙරෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මුදල් මණ්ඩලයේ අනුමතිය ඇතිව, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව ආයෝජන කමිටුවේ මෙහෙයවීම අනුව සේවක අර්ථසාධක අරමුදලේ කළමනාකරණය සිදු කරන්නේද;

(ii) සේවක අර්ථසාධක අරමුදලේ, අරමුදල් කළමනාකරණ අංශය විසින් ඉදිරිපත් කෙරෙන ආයෝජන යෝජනා ඇගැයීම සඳහා ආයෝජන කමිටුව නියමිත පරිදි, අඛණ්ඩව රැස්වන්නේද;

(iii) සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තියට අනුකූලව ආයෝජන තීරණ ගනු ලබන්නේද;

(iv) පසුගිය වර්ෂ දෙක සඳහා ආයෝජන කමිටු රැස්වීම්වල කාර්ය සටහන් සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පසුගිය වර්ෂ දෙකක කාලය තුළදී, ආයෝජන කමිටුවේ,

(i) සියලුම සාමාජිකයන්ගේ නම් සහ පත්වීම් දිනයන් කවරේද;

(ii) රැස්වීම් පවත්වන ලද දින හා සහභාගී වූ සාමාජිකයන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2108/'11

9.

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදල කොටස් වෙළඳපොලේ ගනුදෙනුවල නිරත වන්නේද;

(ii) එසේ නම්, සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් කටයුතු කරන තැරැව්කරුවන්ගේ නම් කවරේද;

(iii) එකී කොටස් තැරැව්කාර සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1645/'11

10.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රදේශයේ පිහිටි බෙලිඅත්ත පොදු වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා වර්ෂ ගණනාවක් ගත වී ඇති බවත්;

(ii) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අවසන් නොකිරීමෙන් ප්‍රදේශයේ ගොවි ජනතාව තම ගොවි නිෂ්පාදන අලෙවි කර ගැනීමේදී ගැටලු රාශියකට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ දිනය කවරේද;

(ii) එහි ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1713/'11

11.

ගරු රවී කරුණානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යයන කටයුතු ආරම්භයේ සිට සම්පූර්ණ කිරීම දක්වා විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු හට නියමිත කාල සීමාව තුළ, එක් එක් වර්ෂයේදී ලබා දෙනු ලබන මූල්‍යාධාර සහ අනෙක් සියලුම ආකාරවල ආධාර සහ ප්‍රතිලාභවල වටිනාකම් කොපමණද;

(ii) 2009, 2010 සහ 2011 වර්ෂවලදී එක් එක් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ එකී මූල්‍ය සහ වෙනත් ආධාර ලැබුණු හා නොලැබුණු ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2008, 2009, 2010 සහ 2011 වර්ෂ තුළ එක් එක් රාජ්‍ය විශ්වවිද්‍යාලය තුළ සිටි ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2008, 2009 සහ 2010 වර්ෂ සඳහා එක් එක් දිස්ත්‍රික්කයෙන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1981/'11

12\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2000 සිට 2005 දක්වා සිදුවූ ස්ත්‍රී දූෂණ සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2006 සිට 2011 දක්වා සිදුවූ ස්ත්‍රී දූෂණ සංඛ්‍යාව කොපමණද;

(iii) එම සිදුවීම්වලට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කාලසීමාවලදී අතවරයන්ට ලක් වූ කාන්තාවන් වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම අතවරයන්ට මුල් වූ පුද්ගලයින් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iii) ස්ත්‍රී දූෂණය වැළැක්වීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග හා අනාගතයේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1646/'11

13\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි, අක්මීමන, කොටගොඩ අත්ථදස්සී කනිෂ්ඨ විද්‍යාලයේ වහලය ප්‍රතිසංස්කරණය කර වැඩි දිනක් යාමට පෙර දිරාපත්වී ඇති බවත්;

(ii) වහලයේ ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරු විසින් බාල වර්ගයේ ලී යෙදීම නිසා මෙම තත්ත්වය ඇතිවී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පාසලේ වහලය ප්‍රතිසංස්කරණය කරන ලද කාල වකවානුව කවරේද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) වහලය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) ටෙන්ඩර් ඉදිරිපත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවන්ගේ නම් කවරේද;

(v) ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලැබූ කොන්ත්‍රාත්කරු හෝ කොන්ත්‍රාත්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත පාසලේ වහලය දිරාපත්වීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා කොන්ත්‍රාත්කරු මගින් නැවත වහලය ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1737/'11

14\.

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමස්ත කිරිපිටි පරිභෝජනය සහ ඒක පුද්ගල කිරිපිටි පරිභෝජනය කොපමණද;

(ii) වාර්ෂිකව ආනයනය කළ කිරිපිටි ප්‍රමාණය කොපමණද;

(iii) වාර්ෂිකව ආනයනය කළ කිරිපිටි ප්‍රමාණයේ වටිනාකම කොපමණද;

(iv) සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කරමින් කිරිපිටි ආනයනකරුවන්ට රජය විසින් ලබාදුන් තථ්‍ය සහනාධාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 සහ 2011 වර්ෂ සඳහා ශ්‍රී ලංකාවේ කිරිපිටි නිෂ්පාදන පිරිවැය කොපමණද;

(ii) ආනයනය කළ කිරි වර්ග සහ දේශීය කිරි නිෂ්පාදනය මත පනවා ඇති සියලුම (ඍජු සහ වක්‍ර) බදු කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1982/'11

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2000 සිට 2005 දක්වා කාල සීමාවේදී වාර්තා වී ඇති ළමා අපචාර සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2006 සිට 2011 දක්වා කාල සීමාවේදී වාර්තා වූ ළමා අපචාර සංඛ්‍යාව කොපමණද ;

(iii) එකී සිදුවීම්වලට හේතු කවරේද;

(iv) අපචාරයන්ට ලක් වූ දරු දැරියන් වෙනුවෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;

(v) එකී අපචාරයන්ට මුල් වූ පුද්ගලයින් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;

(vi) ළමා අපචාර වැළැක්වීම සඳහා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(vii) ඒ සම්බන්ධයෙන් ඉදිරියේ දී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ශෝක ප්‍රකාශ යෝජනා

1.

අභාවප්‍රාප්ත ගරු ජනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*4.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*5.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— “2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*8.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

9.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

10.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**